**10-12-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, කුසල් ඇරඹෙන්නේ නිවසිනි. මින් අදහස් වන්නේ පළමුවෙන්ම ඔබ ජීව අවධානයට පත් වී පසුව අන් අයට ඒ ගැන කියා දීමයි. තමා ජීවයක් වශයෙන් සලකා අන් අයට දැනුම දෙන විට, දැනුමේ අසිපත බලයෙන් පිරී තිබෙනු ඇත.

**ප්‍රශ්නය:** මෙම සංගම යුගයේ දී කුමන කාරණා දෙක සම්බන්ධයෙන් උත්සාහ දැරීමෙන් ද ඔබ සත් යුග සිහසුනේ පාලකවරුන් බවට පත් වන්නේ?

**පිළිතුර:** 1. සතුට හා දුකත් ප්‍රශංසාව හා අපහාසයත් අතර සමානාත්මතා තත්ත්වයක් තබා ගැනීමට උත්සාහ දරන්න. කෙනෙක් වැරදි දේවල් කියමින් කේන්ති ගොස් සිටිනවා නම්, නිහඬ වන්න: ප්‍රතිචාර දක්වන්න එපා. 2. ඔබගේ ඇස් ශිෂ්ඨ කර ගන්න. අශිෂ්ඨ ඇස් සම්පූර්ණයෙන්ම අවසන්ව යා යුතුයි. ජීව අප සහෝදරයින්ය. අන් අය ජීව වශයෙන් සලකමින් ඔවුන්ට දැනුම දෙන්න. ජීව අවධානයට පත් වීමට උත්සාහ දැරූ විට ඔබ සත් යුග සිහසුනේ පාලකවරුන් බවට පත් වනු ඇත. සිහසුන මත අසුන් ගන්නේ සම්පූර්ණයෙන්ම පාරිශුද්ධත්වයට පත් වුණු අයයි.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා ආධ්‍යාත්මික දරුවන්ට කතා කරයි. ජීව වන ඔබලා දැන් තෙවෙනි ඇස ලබා තිබෙනවා. එය දැනුම නම් වූ තෙවෙනි ඇස කියාත් හැඳින්විය හැකියි. ඔබ ඔබලාගේ සහෝදරයින් දෙස බලන්නේ මෙම ඇසිනි. අන් අය දෙස සහෝදරයින් ලෙස බැලූ විට තම භෞතික ඉන්ද්‍රියන් දඟ නොකරනා බව ඔබගේ බුද්ධියෙන් දැන් ඔබ අවබෝධ කර ගෙන තිබෙනවා. දිගින් දිගටම මෙය කරනා විට, අශිෂ්ඨ වී ඇති ඇස් ශිෂ්ඨ වීමට පටන් ගන්නවා. පියා කියනවා: ලෝක පාලකවරුන් බවට පත් වීමට ඔබ අනිවාර්යයෙන්ම යම් උත්සාහයක් දැරිය යුතුයි. එමනිසා, දැන් මේ උත්සාහය දරන්න. උත්සාහ දැරීම සඳහා බාබා ඔබට අළුත් හා ගැඹුරු කරුණු දිනපතා ලබා දෙනවා. එමනිසා, දැන් මේ උත්සාහය දරන්න. උත්සාහ දැරීම සඳහා බාබා ඔබට අළුත් හා ගැඹුරු කරුණු දිනපතා ලබා දෙනවා. එමනිසා, දැන්, අන් සෑම කෙනෙක්ම සහෝදරයින් කියා සලකමින් ඔවුන්ට දැනුම දීමේ පුරුද්ද ඇති කර ගන්න. එවිට අප සැම සහෝදරයින් කියා කියනා කියමන ප්‍රායෝගික වේවි. ඔබලා දැන් සැබෑම සහෝදරයින්, මන්ද ඔබලා ඔබගේ පියාව දැන් හඳුනනවා. පියා දරුවන් වන ඔබලා සමඟ සේවය කරනවා. දරුවන් වන ඔබලා ධෛර්යමත්ව සිටි විට, පියා උදව් කරනවා. ඉතින් පියා පැමිණ සේවය කිරීමට ඔබව ධෛර්යමත් කරවනවා. එමනිසා, මේක හරිම පහසුයි. නේද? දිනපතාම මෙය පුහුණු කළ යුතුයි: කම්මැලි වන්න එපා. දරුවන් වන ඔබලාට මේ අළුත් කරුණු ලැබෙනවා. සහෝදරයින් වන ඔබලාට බාබා දැන් උගන්වනවාය යන්න දරුවන් වන ඔබලා දන්නවා. ජීව මෙම ආධ්‍යාත්මික දැනුම ඉගෙන ගන්නවා. එය හඳුන්වන්නේ ආධ්‍යාත්මික දැනුම කියලයි. ආධ්‍යාත්මික පියාගෙන් ඔබට ආධ්‍යාත්මික දැනුම ලැබෙන්නේ මේ කාලයේදී පමණයි. මන්ද ඔහු පැමිණෙන්නේ මුළු ලෝකයම වෙනස් කළ යුතු සංගම යුගයේදී පමණයි. මුළු ලෝකයම වෙනස් කළ යුතු වූ මොහොතක දී පමණයි ඔබ මෙම ආධ්‍යාත්මික දැනුම ලබන්නේ. පියා පැමිණ ඔබට ආධ්‍යාත්මික දැනුම ලබා දෙනවා. තමා ජීවයක් බව සලකන්න. ජීව වන ඔබලා අශාරීරික වුණු අතර පසුව මෙහිදී ශරීර ලබා ගත්තා. ආරම්භයේ පටන්ම ඔබ උපත් 84 ක් ගෙන තිබෙනවා. පිළිවෙලින් පහළට එනවා වගේ. දැනුම හා යෝගාවේ දීත් ඔබ උත්සාහයක් දරනවා. මීට පෙර චක්‍රයේ දී ඔබ කොයි ආකාරයේ උත්සාහයක් ද දැරුවේ, නැවතත් එය ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වෙමින් පවතින බව පේන්න තිබෙනවා. තමා වෙනුවෙන් ඔබ උත්සාහ දැරිය යුතුයි. වෙන කිසිම කෙනෙක් වෙනුවෙන් ඔබ උත්සාහ දරන්න යන්නේ නැහැ. තමා ජීවයක් වශයෙන් සලකමින් ඔබ උත්සාහ දැරිය යුත්තේ තමා වෙනුවෙන්මයි. අනිත් අය කරන්නේ මොකක්ද යන්නෙන් ඔබට ඇති ඵලය කුමක්ද? 'කුසල් ඇරඹෙන්නේ නිවසිනි' යන්නෙන් අදහස් වන්නේ පළමුවෙන්ම තමාම හොඳ උත්සාහයක් දරා පසුව ඔබගේ සහෝදරයින් වන අනිත් අයටත් එවන්ම වූ උත්සාහයක් දැරීමට උනන්දු කරවීමයි. පළමුවෙන් තමා ජීවයක් ලෙස සලකා අන් අයට දැනුම දුන් විට, ඔබගේ දැනුම නම් වූ අසිපත බලයෙන් බලවත් වෙනවා. මේ සඳහා කිසියම් උත්සාහයක් දැරිය යුතුයි. එමනිසා, අනිවාර්යයෙන්ම ඔබ සෑම දෙයක්ම ඉවසිය යුතුයි. සතුට හා දුකත්, ගෞරවය හා අගෞරවයත්, ප්‍රශංසාව හා අපහාසයත් සියල්ල ටිකක් ඉවසීමට සිදුවන්නේ මේ කාලයේදීයි. කවුරු හෝ කෙනෙක් කුමන හෝ වැරදි දෙයක් කිව්වොත් නිහඬව සිටින්න. එක්කෙනෙක් නිහඬ වූ විට අනිත් පුද්ගලයාට කිසිවක් කළ හැකි වන්නේ නැත. කෙනෙක් යමක් කියූ විට

අනිත් කෙනාත් ඒ ලෙසින්ම ප්‍රතිචාර දැක්වීමට ගියහොත්, එය හරියට කටින් අත්පුඩි ගසනවා වගේයි. කෙනෙක් දෙයක් කියනා විට අනිත් පුද්ගලයා නිහඬව සිටිනවා නම් සියල්ල ඉන් නිශ්ශබ්ද වෙනවා. පියා උගන්වන්නේ මෙන්න මේ දෙයයි. කෙනෙක්ට තරහ ගිය බව පෙනුනු විට, නිහඬ වන්න. එවිට ඔහුගේ කේන්තිය ඉබේම සිසිල් වී යනු ඇත. එවිට තවත් අත්පුඩියක් (ප්‍රතිචාරයක්) නොගැහෙනු ඇත. ආරවුලක් ඇති වන්නේ ප්‍රතිචාරයක් දැක්වූ විටයි. මෙන්න මේ නිසා තමයි පියා කියන්නේ: දරුවනි, එවන් කාරණා සම්බන්ධයෙන් කිසිඳු විටෙක රාගය හෝ කෝපය යන දුරුගුණ වලින් ප්‍රතිචාර නොදක්වන්න. දරුවන් වන ඔබලා සෑම කෙනෙක්ටම යහපත සැලසිය යුතුයි. මෙච්චර මධ්‍යස්ථාන ආරම්භ කර ඇත්තේ කුමකටද? මීට පෙර කල්පයේ දීත් මෙවන් මධ්‍යස්ථාන ස්ථාපනය කරන්න ඇති. පියා, සියලුම දේවතාවරුන්ගේ දේවතාවරයා. දරුවන් රාශියක් මධ්‍යස්ථාන විවෘත කිරීමේ ආශාවෙන් සිටිනා බව දකිනවා. ඔවුන් කියනවා: මම මධ්‍යස්ථානයක් විවෘත කර සියලුම වියහියදම් දරන්නම්. දවසින් දවස එය තව තවත් වැඩි වේවි. මන්ද විනාශයේ කාලය ලංවෙනවාත් සමඟම, ඔබගේ පැත්තෙනුත් සේවය කෙරෙහි ඇති ආශාව වැඩි වීමට පටන් ගනීවි. බාප් හා ආදා දැන් සිටින්නේ එකටමයි. එමනිසා, ඔබලා කුමනාකාරයේ උත්සාහයක් ද දරන්නේ ඔබලා කුමනාකාරයේ තත්ත්වයක් දිනා ගනීද කියන එක ගැන ඔවුන් බලාගෙනයි සිටින්නේ. ඇතැම් අයගේ උත්සාහය උසස්ම මට්ටමින් තිබෙනවා. අනිත් අය මධ්‍යස්ථ තත්ත්වයකින් සිටිනා අතර ඇතැම් අය සිටින්නේ අඩුම තත්ත්වයකයි. මේක දැකිය හැකියි. පාසලක පවා ශිෂ්‍යයින් ඉහළ පහළ යන්නේ කුමන විෂයන්ගෙන් ද කියා ගුරුවරයෙක් දකිනවා. මෙහිදීත් එය එසේමයි. ඇතැම් දරුවන් තාමත් හොඳ අවධානයක් යොමු කරනා නිසා ඔවුන් ඉහළම ඉහළ අය වශයෙන් සැලකෙනවා. ඇතැම් විට ඔවුන් වැරදි කරමින් බාබාව මතක් නොකර සිටිනවා. එමනිසා, ඔවුන්ව සැලකෙන්නේ ඉතාමත් අඩු මට්ටමක සිටිනා අය වශයෙනුයි. මෙය පාසලක්. දරුවන් කියනවා: බාබා, එක වෙලාවකට මම හරිම සතුටින් සිටිනවා. නමුත් තවත් වෙලාවක මගේ සතුට අඩු වෙනවා. එමනිසා, බාබා දිගටම පැහැදිලි කර කියා දෙනවා: ඔබට සතුටින් සිටීමට උවමනා නම්, ‘මන්මනභව‘ වන්න! තමා ජීවයක් බව සලකා පියාව සිහිපත් කරන්න! ඔබ ඉදිරියේ උත්තරීතර ජීවය අමරණීය සිහසුන මත අසුන් ගෙන සිටිනවා සේ එබ දකිනවා සේ තමාත් ජීවයක් වශයෙන් සලකමින් ඔබගේ සහෝදරයින් දෙසත් බලා පසුව ඔවුන්ට කතා කරන්න. මම මගේ සහෝදරයාට දැනුම දෙමි: සහෝදරියකට නොවෙයි. සහෝදරයාට. ඔබ දැනුම දෙන්නේ ජීවයටයි. මෙම පුරුද්ද ඇති කර ගත් විට, මෙතෙක් කල් ඔබව රවටමින් සිටි ඔබගේ අශිෂ්ඨ ඇස් ක්‍රම ක්‍රමයෙන් අවසන්ව යාවි. ජීවයක් තවත් ජීවයකට කුමක් කරන්නද? ශාරීරික අවධානයට පත් වුණු විට තමයි ඔබලා වැටෙන්නේ. බොහෝ අය කියනවා: බාබා, මගේ ඇස් ශිෂ්ඨ නැහැ. අච්චා. එහෙනම් දැන් ඒ අශිෂ්ඨ ඇස් ශිෂ්ඨ කර ගන්න. ජීව වන ඔබලාට පියා තෙවෙනි ඇස දී තිබෙනවා. සෑම දෙයක් දෙසම තම තෙවෙනි ඇසින් බැලූ විට, ශරීරය දෙස බැලීමේ ඔබගේ පුරුද්ද අවසන්ව යනු ඇත. බාබා දිගටම දරුවන්ට උපදෙස් දෙනවා. ඔහු ඒ දේම තමයි මොහුටත් (බ්‍රහ්මා) කියන්නේ. මේ බාබාත් ශරීරය තුළ සිටිනා ජීවය දෙස බැලිය යුතුයි. එමනිසා, මෙය හැඳින්වෙන්නේ ආධ්‍යාත්මික දැනුම කියලයි. බලන්න ඔබ ලබනා තත්ත්වය කෙතරම් උසස් ද කියලා. එය ඉතාමත් බලවත් තත්ත්වයක්. එමනිසා, ඔබත් ඒ ආකාරයෙන් උත්සාහ දැරිය යුතුයි. ඒ වගේම සෑම කෙනෙකුගේම උත්සාහය මීට පෙර කල්පයේ දී දැරූ ආකාරයෙන්ම තිබෙනා බවත් බාබාට තේරෙනවා. ඇතැම් අය රජවරුන් හා රැජිණියන් වන අතර අනිත් අය පුරවැසියන්ගේ කොටසක් බවට පත් වනු ඇත. එමනිසා, විශේෂයෙන්ම ඔබ සියලු දෙනා වෙනුවෙන්ම භාවනාව මෙහෙයවන විට නළල සිටිනා අනිකුත් ජීව දකිමින් තමාත් ජීවයක්ය කියා සලකන්න. ඔබ කරනා සේවය ඉතාමත් හොඳ සේවයක් වේවි. ජීව අවධානයෙන් මෙහි අසුන්ගෙන සිටිනා අය දකින්නේ ජීවයන් පමණයි. ඉතාමත් හොඳින් මෙය පුහුණු කරන්න. උසස් තත්ත්වයක් දිනා ගැනීමට අවශ්‍ය නම්, ඔබ කිසියම් උත්සාහයක් දැරිය යුතුයි. ජීව වන ඔබලා විසින් දැරිය යුතු එකම එක උත්සාහය මෙය පමණයි. මෙම ආධ්‍යාත්මික දැනුම ඔබට ලැබෙන්නේ එකම එක වතාවකයි: වෙන කිසිම කෙලෙක ඔබට එය ලබන්න බැහැ. කලි යුගයේ දී වත්, ස්වර්ණමය යුගයේ දී වත් ඔබට එය ලද නොහැකියි: එය ලද හැක්කේ සංගම යුගයේදී පමණයි. එයිනුත් එය ලද හැක්කේ බ්‍රාහ්මණවරුන්ටම පමණයි. ඉතාමත් හොඳින් මෙය මතක තබා ගන්න. පළමුවෙන්ම බ්‍රාහ්මණවරයෙක් බවට පත් වූ විට පමණයි ඔබට දේවතාවරුන් විය හැකි වන්නේ. බ්‍රාහ්මණවරයෙක් වෙන්නේ නැතිව දේවතාවරයෙක් වෙන්නේ කොහොමද? මේ උත්සාහය ඔබ දරන්නේ මෙම සංගම යුගයේ දී පමණයි. වෙන කිසිම කලෙක: තමා ජීවයක් වශයෙන් සලකා ඔවුන්ට දැනුම දෙන විට ඔවුනුත් ජීවයක් ලෙස සලකන්න කියා සඳහනක් වන්නේ නැහැ. පියා ඔබට පැහැදිලි කරනා සෑම දෙයක්ම හොඳින් ආවර්ජනය කරන්න. එය හරි ද වැරදි ද, තමාට යහපතක් ලැබෙනවා ද කියා ඔබම විනිශ්චය කර ගන්න. පියා විසින් ඔබට දුන් දැනුම තම සහෝදරයින්ටත් ඉගැන්වීමේ පුරුද්ද එවිට ඔබ තුළ ඇති වේවි. මෙය කාන්තාවන්ටත් පිරිමි අයටත්

දෙගොල්ලන්ටම දිය යුතුයි. අන්තිමට බලනවා නම් දැනුම දිය යුත්තේ ජීවයන්ටයි. ගැහැණු හෝ පිරිමි, සහෝදර හෝ සහෝදරී යන තත්ත්වයට පත්ව සිටින්නේ ජීවයනුයි. පියා කියනවා: ජීව වන ඔබලාට මම දැනුම දෙමි. මම දරුවන් වන ඔබලා දෙස බලනා විට දකින්නේ ජීවයනුයි. ඒ වගේම ඔබගේ පියා වන උත්තරීතර ජීවය ඔබට දැනුම දෙන බවත් ඔබලාට තේරෙනවා. ආධ්‍යාත්මික අවධානයෙන් සිටිනවා කියන්නේ මේකයි. උත්තරීතර ජීවය හා ජීව අතර සිදු වන ආධ්‍යාත්මික දැනුමේ ගණුදෙනුව කියා කියන්නේත් මෙයයි. අමුත්තෙක් පැමිණි ඕනෑම විටෙක, තමා ජීවයක් බව සලකා ඒ ජීවයට පියාගේ හැඳින්වීම ලබා දෙන්න කියා පියා කියා දෙනවා. මෙසේ කරනා විට ඔවුන්ටත් එය විනෝදජනක දෙයක් වේවි. ඔබගේ වචන වල ඒ බලය තිබෙනු ඇත. ඔබ ජීව අවධානයට පත් වන නිසා ඔබගේ දැනුමේ අසිපත බලයෙන් පිරේවි. එමනිසා, හොඳින් පුහුණු වී මෙය කරලාම බලන්න. බාබා කියනවා: මේකත් හරි ද කියා ඔබම බලන්න. දරුවන් වන ඔබලාට මෙය අළුත් දෙයක් නොවෙයි. මන්ද පියා සියල්ල ඉතාමත් පහසුවෙන් පැහැදිලි කර කියා දෙනවා. ඔබ චක්‍රය වටා ගමන් කර පැමිණ දැන් අවසානයට ඇවිත් සිටිනවා. දැන් ඔබ බාබාගේ ස්මරණයෙන් සිටිය යුතුයි. සතෝප්‍රධාන් ලෝකයේ පාලකවරුන් බවට පත් වීමට ඔබට තමෝප්‍රධාන් තත්ත්වයෙන් සතෝප්‍රධාන් තත්ත්වයට පත් වෙමින් සිටිනවා. පසුව ඒ ආකාරයෙන්ම ඔබ ඉණිමගේ පහළට පැමිනේවි. බලන්න, ඔහු පැහැදිලි කරන්නේ කෙතරම් සරළ ලෙස ද කියලා. මම සෑම වසර 5000 කට වරක්ම පැමිණිය යුතුයි. මම නාටක සැලැස්මට බැඳිලයි ඉන්නේ. මා පැමිණ දරුවන් වන ඔබලාට මෙම ඉතාමත් පහසු ස්මරණ වන්දනාව පැහැදිලි කර කියා දෙනවා. පියාව සිහිපත් කිරීමෙන් ඔබගේ අවසන් සිතිවිලි ඔබගේ ගමනාන්තය කරා මෙහෙයවනු ඇත. මෙ අදාල වන්නේ මේ කාලයටයි. කාලයේ අවසන් කාල පරිච්ඡේදය මෙයයි. පියා ඔබට මාර්ගය පෙන්වා දෙන්නේ මේ කාලයේ දීයි. ඔහු කියනවා: නිරන්තරයෙන් මා පමණක් සිහිපත් කරන්න. ඔබට මුක්තිය ලැබෙනු ඇත. ඉගෙන ගැනීම තුළින තමන් කුමන තත්ත්වයකට පත් වේවිද කියා දරුවන්ට තේරෙනවා. මෙහිදීත් තමන් නව ලෝකයේ දේවතාවරුන් බවට පත් වන බව ඔබලාට තේරෙනවා. මෙය අළුත් දෙයක් නොවෙයි. පියා නැවත නැවතත් කියනවා: කිසිවක් අළුත් දෙයක් නොවෙයි. ඔබ ඉණිමගේ ඉහළට ගොස් පහළට පැමිණිය යුතුයි. ජිනීගේ කතාට දන්නවානේ: ඉණිමඟක ඉහළටත් පහළටත් යන්න කියා ඔහුට වැඩක් දුන්නා. මෙම සෙල්ලම ඉහළ යාමත් පහළට පැමිණීමත් අතර සිදු වන සෙල්ලමක්. ස්මරණ වන්දනාව තුළින් ඔබ ඉතාමත් ශක්තිමත් අය බවට පත් වනු ඇත. එමනිසා, පියා මෙහි සිට දරුවන් වන ඔබලාට ජීව අවධානයට පත් වීමේ ක්‍රම රැසක් පෙන්වා දෙනවා. සෑම කෙනෙක්ම දැන් නිවස බලා යා යුතුයි. සම්පූර්ණ උපත් 84 ම ගැනීමෙන් ජීව වන ඔබලා තමෝප්‍රධාන් වෙලා. සතෝ, රජෝ හා තමෝ මට්ටම් පසුකර යන්නේ භාරතයේ ජනතාවයි. වෙනත් කිසිඳු ජාතිකයෙක්ට සම්පූර්ණ උපත් 84 ම ගත් අය කියා කිව නොහැකියි. නාටකයේ සෑම කෙනෙක්ටම ඒ ඒ අයට ආවේණික වූ චරිතයක් රඟපෑමට ඇති බව පියා පැමිණ කියා තිබෙනවා. ජීව ඉතාමත් කුඩායි! එවන් කුඩා ජීවයක් තුළ අවිනාශී චරිතයක් පටිගත වී ඇත්තේ කෙසේදැයි කියා තේරුම් ගැනීමට විද්‍යාඥයින්ටවත් තවම බැහැ. ඉතාමත්ම පුදුම සහගත කාරණය මෙයයි! ජීවයක් ඉතාමත් කුඩයි. නමුත් බලන්න, ඒ ජීවය චරිතය දෙස. ඒකත් අවිනාශීයි. මෙම නාටකයත් අවිනාශී සේම කල් තබාම තීරණය වූවක්. එය ඇරඹුණේ කවදාදැයි කියා කිසිවෙක් අහන්න ඕනේ නැහැ. මේක තමයි ස්වභාවය. මෙම දැනුම ඉතාමත් අරුම සහගතයි. වෙන කිසිම කෙනෙකුට මෙම දැනුම දෙන්න බැහැ. වෙන කිසිම කෙනෙකුට මෙම දැනුම දීමට ශක්තියවත් නැහැ. එමනිසා, දරුවන් වන ඔබලාට පියා දිනපතාම උගන්වනවා. දැන් පුහුණු කරන්න: මම මගේ සහෝදර ජීවයත් මා හා සම කෙනෙක් බවට පත් කරවා ගැනීමට ඔහුට දැනුම දෙමි. සෑම ජීවයකටම අයිතියක් තිබෙනා නිසා ඔහුත් තම උරුමය පියාගෙන් දිනා ගත යුතුයි. බාබා පැමිණ සෑම ජීවයකටම තම සාමයේ හා සතුටේ උරුමය ලබා දෙනවා. අපි අපේ අධිරාජ්‍යය තුළ සිටිනා විට, අනිත් සියලුම ජීව සාම දේශයේ සිටිනා අතර ජයග්‍රහණයේ ජයඝෝෂාව නැගෙයි. අප එහි සිටිනා විට එහි ඇත්තේ සතුටම පමණයි. මෙන්න මේ නිසා තමයි පියා කියන්නේ: පාරිශුද්ධත්වයට පත් වන්න! ඔබගේ පාරිශුද්ධත්වය වැඩි වුණු තරමට ආකර්ෂණය ද වැඩි වනු ඇත. ඔබ සම්පූර්ණයෙන්ම පාරිශුද්ධත්වයට පත් වුණු විට සිහසුන මත අසුන් ගනු ඇත. ඉතින් මෙය පුහුණු කරන්න! තමන් මෙය අසා තිබෙනවා කියා එක කණකින් අසා අනිත් කණින් පිට කර දමන්න එපා. නැහැ. අනෙක් කෙනා ළඟ සිටිමින් එම ඔබේ සහෝදර ජීවයට පැහැදිලි කරනා විටත් තමා ජීවයක් ලෙස සැලකීම පුහුණු කිරීමෙන් තොරව ඔබට ඉදිරියට යන්න බැහැ. ආධ්‍යාත්මික පියා ආධ්‍යාත්මික දරුවන්ට පැහැදිලි කර කියා දෙනවා. ආධ්‍යාත්මික දැනුම කියා හැඳින්වෙන්නේ මේකටයි. ඔබට මෙය දෙන්නේ ආධ්‍යාත්මික පියායි. දරුවන් වන ඔබලා සම්පූර්ණයෙන්ම ආධ්‍යාත්මික හා පාරිශුද්ධ වුණු විට, ඔබලා සත් යුගයේ පාලකවරුන් බවට පත් වනු ඇත. පාරිශුද්ධත්වයට පත් නොවනා අය මාලාවට නොපැමිණෙනු ඇත. මාලාවේත් කිසියම් අර්ථයක් තිබිය යුතුයි. මාලාවේ රහස වෙන

කිසිම කෙනෙක් දන්නේ නැහැ. ඇයි මිනිස්සු එවන් වැලක් (නවගුණ වැල වැනි) ගණන් කරන්නේ? ඒ ඔබ පියාට හොඳින් උදව් කළ නිසා. ඉතින් ඇයි ඔබව මතක් නොකරන්නේ? ඔබලාව සිහිපත් කෙරෙනා අතර වන්දනාත් කෙරෙනවා. ඔබගේ ශරීර පවා වන්දනාවට ලක් වෙනවා. කොහොම නමුත්, මං සම්බන්ධයෙන් නම් වන්දනාවට ලක් වන්නේ ජීවය පමණයි. බලන්න, ඔබලාව දෙයාකාරයකින් වන්දනාවට ලක් වෙනවා. මටත් වඩා! ඔබලා දේවතාවරුන් වන නිසා පසු කලෙක දේවතාවරුන් වශයෙනුත් වන්දනාවට ලක් වෙනවා. මෙන්න මේ නිසා තමයි පූජනීය වීමේ දී ඔබලා මට වඩා ඉදිරියෙන් සිටින්නේ. ඔබගේ ස්මාරකයක නිර්මාණය කර ගැනීමේ දීත් අධිරාජ්‍යය ලැබීමෙනුත් ඔබලා සිටින්නේ ඉදිරියෙනුයි. බලන්න, මම ඔබලාව කෙතරම් උසස් අය බවට පත් කරවනවා ද කියලා! ආදරණීය දරුවන් කෙරෙහි ලොකු ආදරයක් තිබෙනවා. ඒ දරුවන් කර උඩ හෝ ඔළුවේ වාඩි කරවා ගන්නවා. දරුවන් වන ඔබලාව බාබා තබා ගන්නේ උළුව උඩයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ප්‍රශංසනීය හා මතක තබා ගැනීමට වටිනා කෙනෙක් බවට පත් වීමට නම් ආධ්‍යාත්මික වන්න. තමාව, ජීවය පාරිශුද්ධ කර ගන්න. ජීව අවධානයට පත් වීමට උත්සාහ දරන්න.
2. 'මන්මනභාව්' පුහුණුව තුළින් විශාල සතුටකින් සිටින්න. තමා ජීවයක් වශයෙන් සලකා අන් ජීව වලට කතා කරන්න. ඔබගේ ඇස් ශිෂ්ඨ කර ගන්න.

**වරදානය:** ඔබ සම්පූර්ණ යෝගිවරයෙකු වී, මාස්ටර් නිර්මාණකරුවෙකුගේ ස්ථිතියේ දී විපත් පවා විනෝදාස්වාදයක් ලෙසට අත්විඳිත්වා.

ඔබ මාස්ටර් නිර්මාණකරුවෙකුගේ ස්ථිතියේ ස්ථාවරව සිටින විට, විශාලතම විපත විනෝදාස්වාදයේ දර්ශනයක් ලෙස අත්විඳිනු ඇත. ඔබ විනාශයේ විපත ස්වර්ගයට දොරටු විවෘත කිරීමේ මාධ්‍යයක් ලෙස පෙන්වන ආකාරයටම, ඕනෑම කුඩා හෝ විශාල ගැටලුවක් හෝ විපතක් විනෝදාස්වාදයේ ආකාරයක් ලෙස දැකීමට ඉඩ දෙන්න. දුකේ කෑගැසීම් (හයි, හයි) වෙනුවට, පුදුම වචන (ඕහෝ) මතු වීමට ඉඩ දෙන්න. දුක සතුටේ ස්වරූපයෙන් අත්විඳීමට ඉඩ දෙන්න. සතුට හා දුක පිළිබඳ දැනුම ඇති අතර, ඒ දෙකෙන් එකකින්වත් බලපෑමට ලක් නොවන්න. දුක ඔබේ මහත් සතුටේ දින වල පැමිණීම ලෙස සලකන්න, එවිට ඔබ සම්පූර්ණ යෝගිවරයෙකු ලෙස හඳුන්වනු ලැබේ.

**පාඨය:** හෘද සිහසුනෙන් ඉවත් වී සාමාන්‍ය සිතුවිලි ඇති කර ගැනීම යනු ඔබගේ පාද බිම තැබීමයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ වීමට සහ කර්මාතීත් බවට පත්වීමට ගැඹුරු සැලකිල්ලක් දක්වන්න.**

ඕනෑම දෙයක් කරන අතරතුර ඔබේ ශරීරයේ සැහැල්ලුවක් සහ ඔබේ මානසික තත්ත්වයෙහි සැහැල්ලුවක් තබා ගන්න. ඕනෑම ක්‍රියාවක ප්‍රතිඵලයෙන් ඔබේ මනස ඇද ගැනීමට ඉඩ නොදෙන්න. කාර්යය කෙතරම් අඛණ්ඩව වැඩි වුවද, ඒ අනුව සැහැල්ලුව ද වැඩි කර ගන්න. කිසිදු ක්‍රියාවකට ඔබව ඇද ගැනීමට ඉඩ නොදෙන්න, නමුත් ඔබට ආශ්වාදයක් ලබා දෙන තැනැත්තා එය කරන බවත්, ක්‍රියාව කරන තැනැත්තා එය උපකරණයක් ලෙස කරන බවත් දැන, ස්වාමියෙකු (මාස්ටර් ) වන්න. මෙම පුහුණුව වැඩි කරන්න, එවිට ඔබ පහසුවෙන් සම්පූර්ණ හා කර්මාතීත් බවට පත්වනු ඇත.